# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
## இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
## SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION
**(Ministry of Public Administration and Management)**

තැ.පෙ. / த.பெ.இ / P.O. Box 1123

28/10, මලලසේකර මාවත, කොළඹ 07. ශ්‍රී ලංකාව
28/10, மலலசேகர மாவத்தை, கொழும்பு 07. இலங்கை
28/10, Malalasekara Mawatha, Colombo 07. Sri Lanka

Telephone : 94 11 5980200
Fax : 94 11 2584406
E-mail : mail@slida.lk
Web : www.slida.lk


මගේ අංකය : SLIDA/PD/06/20/62-1/2018

ලැබුණා 02 JAN 2019

2018.12.31

ලේකම්
අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

ලේකම්තුමනි,

**FORWARD ව්‍යාපෘතිය යටතේ පුහුණුකරන්නන් පුහුණු කිරීමේ වැඩසටහන සඳහා පුහුණුකරුවන් තෝරාගැනීම**

ඉහත ව්‍යාපෘතිය උතුර, නැගෙනහිර සහ උතුරු මැද පළාත්වල සේවය කරන ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා JICA ආයතනයේ මූල්‍ය අනුග්‍රහය මත ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතිය මෙම පළාත් වල ඉදිරි පෙළ නිලධාරීන්ගේ කුසලතා වර්ධනය සඳහා ඉවහල් වී ඇති බව JICA ආයතනය මඟින් සිදු කරන ලද ඇගයීමකින් තහවුරු වී ඇත. එබැවින්, වැඩසටහන බස්නාහිර, දකුණු, සබරගමුව, මධ්‍යම, ඌව හා වයඹ පළාත්වල දිස්ත්‍රික් පරිපාලන නිලධාරීන්ගේ පුහුණු කුසලතා වර්ධනය සඳහා GIZ (Deutsche Gesellschaft für Internationale Zusammenarbeit) ආයතනයේ මූල්‍ය අනුග්‍රහය මත ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර ඇත.

මෙම පුහුණුකරන්නන් පුහුණු කිරීමේ වැඩසටහන මඟින් අපේක්ෂා කරනු ලබන්නේ ප්‍රාදේශීය පරිපාලනයේ නිරතව සේවය කරන ඉදිරි පෙළ නිලධාරීන් පුහුණු කිරීමය. වැඩසටහනහි විෂය අන්තර්ගතය පහත පරිදි වේ.

මොඩියුලය 1 : සන්නිවේදන කුසලතා හා ගැටුම් කළමනාකරණය

මොඩියුලය 2 : ප්‍රජා බලගැන්වීම, නායකත්වය හා කණ්ඩායම්කරණය

මොඩියුලය 3 : යහපාලනය, වගකීම සහ තත්ත්ව වර්ධනය

මොඩියුලය 4 : ප්‍රජා මූලික සැලසුම්කරණය හා ව්‍යාපෘති කළමනාකරණය

මොඩියුලය 5 : ව්‍යවසායකත්ව හා ජීවනෝපායික සංවර්ධනය

එබැවින් පුහුණුව පැවැත්වීම සඳහා ඔබ අමාත්‍යාංශය මඟින්, ප්‍රාදේශීය ලේකම්/ සහකාර ප්‍රාදේශීය ලේකම් හෝ වෙනත් සුදුසු නිලධාරීන් (ඉහත පළාත් හයට අදාළ දිස්ත්‍රික්කයකින් නාමයෝජනා 8 බැගින්) නම් කර, ඔවුන්ගේ තොරතුරු **2019.01.14** දිනට පෙර ඇමුණුම -1 හි සඳහන් ආකෘතියට අනුව ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

පළමු පුහුණු වැඩසටහන 2019.01.25 හා 26 දෙදින තුල හා දෙවන වැඩසටහන 2019.02.22 හා 23 දෙදින තුල නිලධාරීන් 40 බැගින් වූ කණ්ඩායම් දෙකක් වශයෙන් පැවැත්වෙන අතර සහභාගීවන්නන් හට ආහාර පාන, පුහුණු ද්‍රව්‍ය, නවාතැන් පහසුකම් ආදිය අප ආයතනය මඟින් සපයනු ලැබේ. එමෙන්ම වැඩසටහනේ පළමු දින ප.ව 8.00 දක්වා දේශන පවත්වන බැවින් අප ආයතනයේ නේවාසික පහසුකම් ද සලසා දෙනු ලැබේ.

මේ සම්බන්ධයෙන් ඔබගෙන් ලැබෙන කාරුණික සහයෝගය ඉතාමත් අගය කරමි.

කේ.එම්.එස්.ඩී.ජයසේකර
අධ්‍යක්ෂ ජනරාල් ( වැ.බ)

පිටපත :

1. දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කොළඹ
2. දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල
3. දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර
4. දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර
5. දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ
6. දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර
7. දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය
8. දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර
9. දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොනරාගල
10. දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල
11. දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල
12. දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල
13. දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට
14. දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ
15. දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම

කා. දැ. පි.